බලාගැනීම මැනවි. සමහරෙක් යාන වාහනවල හිඳගෙන යති. තවත් අය ඒ වාහන ඔසවාගෙන යති.

පිනින් පැමිණුන දෙය - මද යයි වැඩි ඉසුරු පතනුවෝ
උවදුරු ඇති ගඟෙක - පිනුම් නොදැන පනිනුවෝ වෙත්

තමාගේ පින් හේතුවෙන් ලැබුණු දේ ප්‍රමාණවත් නොවේ යයි සිතා වැඩි ඉසුරු බලාපොරොත්තු වන්නෝ උපද්‍රව ඇති ගංගාවක පිහිනන්නට නොදැන පනින්නවුන් වැනිවෙත්.

නොමද අකුසල් කොට - අවිදු විදු සත කරණ පින්
දුගඳ වැල හි සිට - අලෙවි කරනෙවි සුවඳ ඇඟ පිට

මෝඩ ජනයා පාප කිරීමෙන් අනතුරුව පින්කිරීම දුර්ගන්ධ වළෙක මතුපිට සුවඳ ආලේප කරන්නාක් බඳුය.

නුවණැසෙකි සුවියත් - සත සමඟ වනු ඇසකි දන හ ට
නොනැසෙන මේ ඇස් දෙක - නැති සත නොමඟ යනු වරද හැකි

ඥානය යනු එක් ඇසකි. ඉතා වියත් ජනයා සමඟ එක්වීම තවත් ඇසකි. විනාශ නොවන්නාවූ මේ ඇස් දෙක නැති සත්වයා නොමඟ යාම කවර වරදද ?

අදමින් ලත් ඉසුරු - නොපවතී සොරුන් සෙවූ දන මෙන
දහමින් ලන ඉසුරු - සැපත් එසුරිඳු ලත් වැනී

දැහැමින් ඉපයූ සම්පත් සොරුන් සපයාගත් සම්පත් මෙන් නොපවතී. ධර්මයෙන් ලද සම්පත් ශ්‍ර........ සම්පත්තියට සමාන වේ.

තිරසරව වැඩ කළ කෙතට - සිවු පා නොවදින්නාක් මෙ න්
පිරිසිදුව පින් කළ සතන් හට දුක් නොවේ කිසි කලෙකත්

ස්ථිරව වැට කඩොලු බැඳි කුඹුරට සිව්පාවුන් ඇතුළු නොවන්නාක් මෙන් පිරිසිඳු සිතින් පින්කළ සත්වයන් හට කවර කලෙකවත් දුකක් සිදු නොවේ.

නොකා නොදී ඉසුරු තබා - දිවි රකනා අය අවිය ත්
කෙත් රැකවලට බැඳි මිනිස් රුවැති තනින් බැඳ ලූ

තමන් කන්නේත් නැතිව අනුනට දෙන්නෙත් නැතිව වස්තුව සඟවා ගෙන ජීවිතය පවත්වාගෙන යන මෝඩයන් කුඹුරේ ආරක්ෂාවට තණකොළවලින් බැඳ ලූ පඹයන් වැනි වේ.

කම්මැලියාහට සිල්ප නොසිදුවේ - එබැවින් නිදන වේ
නිදනට මිතුරු නැත නිතරම - එහෙයින් නිතරම සිතට සැප නැත්

කම්මැලියාහට ශිල්ප ශාස්ත්‍ර උගත හැක්කේ නොවේ. ඒ හේතුවෙන් හෙතෙම නිර්ධන වේ. නිර්ධන තැනැත්තාට මිත්‍රයෝ නොවෙති. එමනිසා නිරන්තරයෙන් සිතෙහි සැපතක් ද නැත.

රදුන් ලොබැති දෙයට - ලෝබ නොකරවි පණට සිතැතොත්
ගොදුරුපත් පළගැටි - වැටුප මැද වැද නැසෙන ලෙස වේ

තමාගේ ප්‍රාණයට ආදරයක් ඇත්නම් රජවරුන් (පාලකයන්) ලෝභ කරන දෙයට ලෝභ නොකරවී. එසේ කරන්නා ගොදුරුව ලෝභයෙන් දැල්වෙන් පහනට වදින පලගැටියන් මෙන් නැසේ.

නොතලා කුසුම් රොන් - සෙමෙන් ගන්නා බිඟුන් විලසින්
නොපෙලා ලොව සතුන් - අය බදු ගනිත් දෙලොව වැඩ වේ

ලෝකයේ සත්වයන් පීඩාවට පත් නොකොට පාලකයන් අයබදු ගනිතොත් මෙලෝ එලෝ දෙකෙහිම වැඩ සිදු වේ.

අනුවන දුරැර සැප - වාසය කර මෙලොව නිරතුරින්
සඟමොක් සැප ලබනුව - බලා මේ ලෝකෝපකාරය

"ඥානාන්විතව ලෝකයේ පවතින් නොයෙක් කටයුතු දැනගනු පිණිසත් අනුවණකම් දුරුකොට මේ ලෝකයෙහි නිරන්තරයෙන් සැප සේ වාසය කිරීමට අවසානයේ ස්වර්ග මෝක්ෂ සම්පත්තිය ලබාගැනීම පිණිසත්, නොයෙක් උපමායෙන් සැරසූ මේ ලෝකෝපකාරය බැලීම යහපත්ය" යන ප්‍රකාශනයෙන් මෙම කාව්‍ය සංග්‍රහය නිමාවට පත්වේ.

රාජ්‍ය පාලය, පින් පව්, අඹු සැමි සම්බන්ධතා, දරුමව්පිය සෙනෙහස මිනිස් වගකීම් හා යුතුකම් ඉගෙනුම හා උගත්කම මිනිස් ගුණ හා නුගුණ, සහජීවනය වැනි පුළුල් සමාජ සත් චාරිත්‍ර ධර්ම දෙස ධනාත්මකකෝණයෙන් බලා රචිත මෙම ග්‍රන්ථයේ රචනා විලාසය බුද්ධ ධර්මයේ ශික්ෂා පද ශෛලීය ආවර්ජනය කරවයි.

ඊළඟ ලිපියෙන් සුභාෂිතයට පිවිසේ.

## කවියෙන් කියන වග



මහ රජුව රැකගත්
චෙස් ලොව සැවොම බලවත්
අබියෝග ජයගත්
විරයෝ වෙති රටක් රැකගත්

**වෙත්තසිංහ**

House in 22P for Sale
Dehiwala Aththidiya

Right next to Arpico Supermarket !

Suitable for both residential and commercial purposes.

Perfect location for a housing/apartment project.

AUD 350,000 or
exchange with a property in Australia would be considered

Mobile/Viber/WhatsApp +94 76 947 0 937
Mobile (Ausi) +61 435 019 777

Alpha Academy 2017
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

To request an application,
please text student name, Class and school to
0457908918